(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 53.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2010 නොවැම්බර් මස 27 වැනි සෙනසුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0038/'10

1.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වල අයිතිය, ගිවිසුම්වලට එළැඹීමෙන් තොරව නීත්‍යානුකූල නොවන ආකාරයෙන් විවිධ පුද්ගලයින් වෙත පවරා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම් පවරා දී ඇති පදනම, පැවරුම්ලාභීන්ගේ නම් හා ලබා දී ඇති ඉඩම්වල ප්‍රමාණයන් කොපමණද;

(ii) නීත්‍යානුකූල ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් තොරව එම ඉඩම් පවරා දුන් නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0464/'10

2.

ගරු නූර්දීන් මෂූර් මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2004 සිට 2010 දක්වා වූ කාලය තුළ නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් සෘජු වශයෙන් හෝ එම අමාත්‍යාංශ යෝජනා සැලැස්මක් අනුව වෙනත් අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් හෝ ක්‍රියාත්මක කළ වැඩ සටහනක් යටතේ, පුත්තලම, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල අවතැන්වූ පවුල්වල කාන්තාවන්ට ස්වයං රැකියාවල නියැළීම පිණිස ලබා දෙන ලද මහන මැෂින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම මහන මැෂින්ලාභීන්ගේ නම්, ලිපිනයන්, ඒවා නිකුත් කළ දිනයන් සහ එම වවුචර්පත් අංක කවරේද;

(iii) එම එක් එක් මහන මැෂිමේ වටිනාකම සහ එක් එක් මහන මැෂිම මිලදී ගැනීම සඳහා වියදම් කළ මුදල කොපමණද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා වෙන්කළ මුළු මුදල කොපමණද;

(ii) එයින් වියදම් කළ මුදල කොපමණද;

(iii) වියදම් සිදු කළ වැය ශීර්ෂය කවරේද;

යන්න එක් එක් වර්ෂයට අදාළව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0467/'10

3\.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය කළ පතිරගේ නිහාල් පෙරේරා සහ එස්. බී. විමලවීර විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ අංක එච්.ආර්.සී./5432/03 සහ එච්.ආර්.සී/5798/03 දරන පැමිණිලි සම්බන්ධයෙන් "සහකාර ආරක්ෂක නිලධාරී තනතුරට අනික් පිරිස පත් කළ දින සිට පත්කර, වැටුප් පියවර යථාවත් කළ යුතු බවට" එම කොමිසම 2005.12.12 දින නිර්දේශ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2005 අනුව මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය බැඳී ඇති බව එතුමා පිළිගන්නේද;

(ii) ඉහත නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කළ පෙත්සම සම්බන්ධයෙන් 2009.10.22 දින එළැඹි එකඟතාවය පරිදි ඔවුන් දෙදෙනාගේ පත්වීම් තවමත් ලබාදී නැත්තේ මන්ද;

(iii) මහජන පෙත්සම් කාරක සභාව වරාය අධිකාරියේ සභාපති වෙත යැවූ 2009.11.24 සහ 2010.02.09 දිනැති ලිපිවල සඳහන් නියමයන් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(iv) එම කාරක සභාවේදී ඇතිවූ එකඟතාවය අනුව අදාළ පත්වීම් සිදුකිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0501/’10

4\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන පාසල් පෝෂණ වැඩසටහන් කවරේද;

(ii) ඒ වෙනුවෙන් රජය වැය කරන මුදල කොපමණද;

(iii) එම දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කර ඇති මුදලින් පාසල් පෝෂණ ව්‍යාපෘති සඳහා වෙන්කළ ප්‍රතිශතය කොපමණද;

(iv) පාසල් පෝෂණ ව්‍යාපෘති වෙනුවෙන් වෙන් කළ මුදල ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0545/’10

5\.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 1948 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ එම ක්‍රීඩක නාම ලේඛනය සහ එම ක්‍රීඩකයින් විසින් ලබාගත් ජයග්‍රහණත්, ඊට අදාළ වර්ෂයනුත් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉදිරි ඔලිම්පික් ක්‍රීඩා උළෙල පවත්වනු ලබන ස්ථානය සහ වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා අප රට වෙනුවෙන් ක්‍රීඩකයින් සහභාගි වන්නේද;

(iii) ඒ සම්බන්ධයෙන් දියත් කර ඇති වැඩ පිළිවෙළ කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0553/'10

6.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ කොඩ්ඩායිකල්ලාර් පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුණේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0563/'10

7.

ගරු ආර්. යෝගරාජන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වර්ෂයේදී රජයට පවරාගැනීමට නියමිතව තිබූ වතු රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ දක්වා රජයට පවරාගෙන ඇති වතු රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iii) එලෙස පවරා ගන්නා ලද එක් එක් රෝහලේ සිදු කරන ලද යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් කවරේද;

(iv) ඉහත කී රෝහල් සඳහා බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩලය කවරේද;

(v) එකී රෝහල්වල වත්මන් කාර්ය මණ්ඩලය නව සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කරගැනීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0626/'10

8\.

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 නොවැම්බර් මස 13 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවට බැංකු සහායකයින් බඳවා ගැනීම සඳහා පැවත්වූ තරග විභාගයට ඉදිරිපත් වූ මුළු විභාග අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විභාගයෙන් සමත්වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එහි ප්‍රතිඵල මත මේ වන විට මහ බැංකුවට බැංකු සහායකයන් බඳවා ගෙන තිබේද;

(iv) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත විභාගයේ ප්‍රතිඵල මෙතෙක් විභාග අපේක්ෂයන්ට පෞද්ගලිකව නිකුත් කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඊට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0044/'10

9\.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ආනයනය කරන ලද හා දේශීයව නිෂ්පාදනය කරන ලද සහල්, සීනි, තිරිඟු පිටි, පරිප්පු, කිරිපිටි, ලූනු හා මිරිස් ආදී භාණ්ඩ මුළු ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත භාණ්ඩ මත පනවා ඇති තීරුබදු, වැට් බදු හා නිෂ්පාදන බදු ප්‍රමාණයන් කවරේද;

(iii) ඉහත (ii) ට අනුව තීරුබදු හා බදු මගින් උපයාගත් මුළු ආදායම කොපමණද;

යන්න පසුගිය වර්ෂ 5ට අදාළව, වෙන් වෙන් වශයෙන්, එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0502/'10

10\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන කරදිය ධීවර තොටුපලවල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තොටුපලවල් ආශ්‍රිතව පිහිටුවා ඇති ධීවර සමිති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ධීවර තොටුපලවල් ආශ්‍රිත ධීවර ප්‍රජාව වෙනුවෙන් රාජ්‍ය මැදිහත්වීම තුළින් ක්‍රියාත්මක වන සහන වැඩ සටහන් කවරේද;

(ii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) එම මුදල අදාළ කටයුතු සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0554/’10

11.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ පෙරියකල්ලාර් පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුණේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0564/’10

12.

ගරු ආර්. යෝගරාජන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුස්සැල්ලාව ප්‍රොටොෆ් (Protoft) වතුයායේ පිහිටා ඇති වතු රෝහල 2009 වර්ෂයේදී රජයට පවරා ගත් බවත්;

(ii) වර්ෂයකට ඉහත එහි නව ගොඩනැගිල්ලක් ඉදිකොට වැඩ නිම කළ බවත්;

(iii) එම ගොඩනැගිල්ල වසා දමා තිබෙන බවත් සහ එය මහජනයාගේ ප්‍රයෝජනය සඳහා විවෘත කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගොඩනැගිල්ල විවෘත කොට එය මහජනයාගේ ප්‍රයෝජනය සඳහා යෙදවීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එය විවෘත කරනු ලබන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0095/'10

13.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010.05.01 දින සිට 2010.07.01 දින දක්වා කැබිනට් අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් හට ගෙවූ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය භුක්ති විඳින අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0503/'10

14.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන මිරිදිය ධීවර තොටුපලවල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තොටුපලවල් ආශ්‍රිතව පිහිටුවා ඇති ධීවර සමිති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ධීවර තොටුපලවල් ආශ්‍රිත ධීවර ප්‍රජාව වෙනුවෙන් රාජ්‍ය මැදිහත්වීම තුළින් ක්‍රියාත්මක වන සහන වැඩ සටහන් කවරේද;

(ii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) එම මුදල අදාළ කටයුතු සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0617/'10

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිස්කල් භාරකාරමාතා තනතුර සඳහා මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු සඳහා බඳවාගැනීම් සිදු කරන්නේද;

(iii) නොඑසේ නම්, මේ වන විට එම බඳවා ගැනීම් අවසන් කර තිබේද;

(iv) එම තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— 2010 නොවැම්බර් මස 30 වැනි අඟහරුවාදා, දෙසැම්බර් මස 01 වැනි බදාදා, 02 වැනි බ්‍රහස්පතින්දා, 03 වැනි සිකුරාදා, 04 වැනි සෙනසුරාදා, 06 වැනි සඳුදා, 07 වැනි අඟහරුවාදා, 08 වැනි බදාදා, 09 වැනි බ්‍රහස්පතින්දා, සහ 10 වැනි සිකුරාදා, යන දිනයන් '2011 විසර්ජන පනත් කෙටුම්පත' සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 70(2) හි කුමක් සඳහන්ව තිබුණද, '2011 විසර්ජන පනත් කෙටුම්පත' සලකා බැලීම සඳහා 2010 නොවැම්බර් මස 30 වැනි දින සිට දෙසැම්බර් මස 09 වැනි දින දක්වා ඇති වෙන් කල දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ.භා. 9.30 සිට අ.භා. 7.30 දක්වා විය යුතු ය. අ.භා. 7.00ට ස්ථාවර නියෝග අංක 7හි (5) සහ (6) ඡේදයන් ක්‍රියාත්මක විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග 70(2) හි කුමක් සඳහන්ව තිබුණද, '2011 විසර්ජන පනත් කෙටුම්පත' සලකා බැලීම සඳහා 2010 දෙසැම්බර් මස 10 වැනි සිකුරාදා දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 6.00 දක්වා විය යුතු ය. අ.භා. 6.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1

විසර්ජන පනත් කෙටුම්පත (2011) — (පස්වැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2010 නොවැම්බර් 22) [1].

*2.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 41 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සභා (වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර)" නියෝගයේ 3 වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2009 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1633 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*3.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 39 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන, ජනාවාස හා රණවිරු සුභසාධන අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සභා (ලියාපදිංචි කිරීමේ)" නියෝගයෙහි 2(2) වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2010 අප්‍රේල් මස 12 වැනි දින අංක 1649/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.11.09 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතුය.

*5.

කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා,— ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත යටතේ නියෝග,— 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 20 අ වැනි වගන්තියේ සඳහන් මාර්ගෝපදේශවලට අනුකූලව එකී පනතේ 20 අ වැනි වගන්තිය සමග කියවිය යුතු 31 වැනි වගන්තිය යටතේ කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 1667/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.11.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව — රු. 100,000,000 සිට රු. 960,000,000 දක්වා

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*7.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*8.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*10.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*11.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*12.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*13.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*14.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*15.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*16.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*17.

පීඩාකාරී ආයුධ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*18.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

19.

තාරුණ්‍යයට හෙටක් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත—දෙවැනි වර කියවීම

20.

රතු පියුම (ජාත්‍යන්තර) ශ්‍රී ලංකා සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත—දෙවැනි වර කියවීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1] "පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---